IslamHouse.com

# රමදාන් මාසයේ අල්ලාහ්ගෙන් ප්‍රාර්ථනා කරන්නේ කෙසේද?

# كيف نقترب إلى الله في شهر رمضان؟

< سنهالية -සිංහල >

## ජාසිම් ඉබ්නු දඉයාන්

اسم المؤلف

جاسم بن دعيان

:මුහම්මද් අසාද්

ترجمة:

مراجعة:محمد آساد

# රමදාන් මාසයේ අල්ලාහ්ගෙන් ප්‍රාර්ථනා කරන්නේ කෙසේද?

ජාසිම් ඉබ්නු දඉයාන්

وَإِذَا سَأَلَكَ عِبَادِي عَنِّي فَإِنِّي قَرِيبٌ ۖ أُجِيبُ دَعْوَةَ الدَّاعِ إِذَا دَعَانِ ۖ فَلْيَسْتَجِيبُوا لِي وَلْيُؤْمِنُوا بِي لَعَلَّهُمْ يَرْشُدُونَ (١٨٦)

"තවද මාගේ ගැත්තන් මා ගැන නුඹෙන් විමසූ විට සැබැවින්ම මම සමීපතය. ඇරයුම් කරන්නාගේ ඇරයුමට මම පිළිතුරු දෙමි. එබැවින් ඔවුන් යහමඟ ලබන්නට හැකි වනු පිණිස ඔවුන් මාගේ පිළිතුර අපේක්ෂා කරත්වා! තවද, මා විශ්වාස කරත්වා!" සූරා බකරා 2:186

## අපගේ යටහත් පහත්වීම් භාවය සොයා ගැනීම:

අල්ලාහ් ගැන අවබෝධය තියුණු කර ගැනීමට, අනතුරු ව අපව මවා විවිධ හැඩ දුන් අල්ලාහ් වෙත අධික ව කීකරු වී ඔහු පෙන්වා දුන් මාර්ගයේ අපගේ ක්‍රියාවන් හැඩ ගැසීම පිණිස ඕනෑ කමින් හා සිය කැමැත්තෙන් පියවර ගැනීම සඳහා සුදුසු අවස්ථාව රමදාන් මාසයයි. මේ මාසයේ සමාජයේ උපවාසය, සමූහ වශයෙන් ඉෆ්තාර් නම් උපවාසය අවසන් කිරීම, සමාජයේ එකමුතුභාවය පෙන්වන තරාවීහ් නැමදුම, අල්ලාහ්ගේ කීර්තිය පැවසීමෙහි සිත යොමු කිරීම යන සියලු කටයුතු, එයට වඩා ගැඹුරු යම් දැයකට අපව සූදානම් කරයි.

අල් කුර්ආනය යළිත් වරක් පාරායනා කිරීම, එහි අර්ථ පිළිබඳ ව මෙනෙහි කිරීම, භාවනා කිරීම තුළින් අපගේ පෞද්ගලික ජීවිතය පිළිබඳ ව පරීක්ෂා කිරීම, අනතුරුව අප තුළ වෙනස් කළ යුතු යමක් තිබේ නම් ඒවා වෙනස් කර, අපගේ ජීවිතය පුනරුත්ථාපනය යන සියලු දේ මෙම පුන්‍ය මාසය වන රමදාන් හි සිදු විය යුතුය. එය සඳහාම අපි උපවාසයේ යෙදිය යුතුමයි.

شَهْرُ رَمَضَانَ الَّذِي أُنزِلَ فِيهِ الْقُرْآنُ هُدًى لِّلنَّاسِ وَبَيِّنَاتٍ مِّنَ الْهُدَىٰ وَالْفُرْقَانِ ۚ فَمَن شَهِدَ مِنكُمُ الشَّهْرَ فَلْيَصُمْهُ ۖ وَمَن كَانَ مَرِيضًا أَوْ عَلَىٰ سَفَرٍ فَعِدَّةٌ مِّنْ أَيَّامٍ أُخَرَ ۗ يُرِيدُ اللَّهُ بِكُمُ الْيُسْرَ وَلَا يُرِيدُ بِكُمُ الْعُسْرَ وَلِتُكْمِلُوا الْعِدَّةَ وَلِتُكَبِّرُوا اللَّهَ عَلَىٰ مَا هَدَاكُمْ وَلَعَلَّكُمْ تَشْكُرُونَ ﴿١٨٥﴾

රමළාන් මාසය, එහි මිනිසාට මඟ පෙන්වන්නක් ලෙසත් යහමඟ පැහැදිලි කරන්නක් ලෙසත් නිර්ණායකයක් ලෙසත් අල්-කුර්ආනය පහළ කරනු ලැබීය. එබැවින් කවරෙකු එම මාසයට සම්මුඛ වන්නේ ද ඔහු එහි උපවාසය රකිත්වා! තවද කවරෙකු රෝගියෙකු ව හෝ ගමනක නිරත ව සිටින්නේ ද එසේ නම් වෙනත් දින ගණන් කර (උපවාසයේ නියැළෙ)ත්වා! අල්ලාහ් නුඹලාට පහසු ව ප්‍රිය කරයි. අපහසුතාව ඔහු ප්‍රිය නොකරයි. (මෙම සහනය) නුඹලා දින ගණන් සම්පූර්ණ කරනු පිණිස ද අල්ලාහ් නුඹලාට මඟ පෙන්වූ දෑ සඳහා ඔහු ව විභූතිමත් කරනු පිණිස ද නුඹලා කෘතඥතාව පුද කිරීමට හැකි වනු පිණිස ද වේ.” සූරා බකරා 2:185

කිසිදු හේතුවක් මත මෙම උපවාසය මඟ හැරිය නොහැක. මෙම උතුම් අවස්ථාව අතපසු කළ නොහැක. අල්ලාහ් අපහට දෙන

උපකාරය වන ඔහුට සම්පූර්ණ ව අවනත වීම තුළින් අපගේ ජීවිතයේ අරමුණ ඉටුකර ගත හැකි වේ.

إِذَا جَاءَ نَصْرُ اللَّـهِ وَالْفَتْحُ ﴿١﴾

"අල්ලාහ්ගේ උදව්ව පැමිණෙන විට.... " සූරා අන් නස්ර් 110:1

## අල්ලාහ්ගේ මෙම උදව් අප සම්පූර්ණයෙන් ලබා ගන්නේ කෙසේද?

1. පළමුව, මෙම උදව් ව අපට වරප්‍රසාදයක් බව ද එය ලබා ගන්නේ කුමන තැනකින් ද, එයට අදාළ කොන්දේසි කුමක් ද යන්න අප දැන ගත යුතුය.

وَقَالَ رَبُّكُمُ ادْعُونِي أَسْتَجِبْ لَكُمْ ۚ إِنَّ الَّذِينَ يَسْتَكْبِرُونَ عَنْ عِبَادَتِي سَيَدْخُلُونَ جَهَنَّمَ دَاخِرِينَ ﴿٦٠﴾

"නුඹලා මාගෙන් අයැදිවු. මම නුඹලාට පිළිතුරු දෙන්නෙමි. සැබැවින්ම කවුරුන් මට ගැතිකම පෑමට එරෙහිව උඩංගු වන්නේද ඔවුන් නින්දිත ලෙස නිරයට ඇතුළු වනු ඇත." සූරා 40:60 යනුවෙන් අල්ලාහ් ප්‍රකාශ කරයි.

هُوَ الْحَيُّ لَا إِلَـٰهَ إِلَّا هُوَ فَادْعُوهُ مُخْلِصِينَ لَهُ الدِّينَ ۗ الْحَمْدُ لِلَّـهِ رَبِّ الْعَالَمِينَ ﴿٦٥﴾ قُلْ إِنِّي نُهِيتُ أَنْ أَعْبُدَ الَّذِينَ تَدْعُونَ مِن دُونِ اللَّـهِ لَمَّا جَاءَنِيَ الْبَيِّنَاتُ مِن رَّبِّي وَأُمِرْتُ أَنْ أُسْلِمَ لِرَبِّ الْعَالَمِينَ ﴿٦٦﴾

“ඔහු සදා ජීවමානය. ඔහු හැර (නැමදුමට) වෙනත් දෙවිදෙකු නොමැත. එබැවින් දහමෙහි ඔහුට චිත්ත ඒකාග්‍රතාවෙන් ප්‍රාර්ථනා කරවු. සියලු පැසසුම් සමස්ත විශ්වයේ පරමාධිපති වන අල්ලාහ් සතුය.

මාගේ පරමාධිපතිගෙන් පැහැදිලි සාධකයන්මා වෙත පැමිණි කල්හි අල්ලාහ් හැර නුඹලා අයැදින්නන්ට මා නැමදීම සැබැවින්ම මම තහනම් කරනු ලැබුවෙමි. යැයි (නබිවරයාණනි!) පවසවු.” සූරා 40: 65 සහ 66

ادْعُوا رَبَّكُمْ تَضَرُّعًا وَخُفْيَةً ۚ إِنَّهُ لَا يُحِبُّ الْمُعْتَدِينَ (٥٥) وَلَا تُفْسِدُوا فِي الْأَرْضِ بَعْدَ إِصْلَاحِهَا وَادْعُوهُ خَوْفًا وَطَمَعًا ۚ إِنَّ رَحْمَتَ اللَّهِ قَرِيبٌ مِّنَ الْمُحْسِنِينَ (٥٦)

“නුඹගේ පරමාධිපතිගෙන් බැගෑපත්වද, හය භක්තියෙන්ද අඬගසනු. සැබැවින්ම, ඔහු සීමාව ඉක්මවන්නන් ප්‍රිය නොකරන්නේය.

භූමියෙහි එය සංස්කරණය කළායින් පසු අවැඩ නොකරවු. බියෙන්ද අභිලාෂයෙන්ද ඔහුට අඬ ගානු. සැබැවින්ම අල්ලාහ්ගේ දයාලුභාවය යහකම් කරන්න වු ළඟය.” 7:55 සහ 56

2. දෙවනුව, මෙම උදව් ව අයැදීම, දැනුවත්ව සහ සිතාමතාම වාචික ව දෑත් දිගු කොට, අල්ලාහ් දෙන බව පොරොන්දු වූ දෑ ලැබෙන බව බලාපොරොත්තුවෙන් අල්ලාහ්ගෙන් ඉල්ලීම් කළ යුතුය. අල්ලාහ්ගෙන් පමණක් ලැබිය හැකි මෙම උදව් ව බව සැබෑ අවබෝධයෙන් පැතිය යුතුය.

قُلْ أَمَرَ رَبِّي بِالْقِسْطِ ۖ وَأَقِيمُوا وُجُوهَكُمْ عِندَ كُلِّ مَسْجِدٍ وَادْعُوهُ مُخْلِصِينَ لَهُ الدِّينَ ۚ
كَمَا بَدَأَكُمْ تَعُودُونَ (٢٩)

"මාගේ පරමාධිපති සාධාරණය ඉෂ්ට කරන ලෙස මට අණ කර ඇත. තවද, සෑම ස්ථානයෙහිම නැමදුම් කරන විට ඔහු වෙත පමණක් මුහුණ හරවන ලෙසද, ඔහු වෙත පමණක් ඇරයුම් කරන ලෙසද, ඔහු වෙත පමණක් විශ්වාසය තබා අවංක ව ඇරයුම් කරන ලෙසද අණ කර ඇත. ඔබේ යළි පැමිණීම ඔහු වෙතය." සූරා 7: 29

අල්ලාහ්ගෙන් තිළිණ ලබා ගනු පිණිස සූදානම් විය යුත්තේ අපමය යන අතර, එය අල්ලාහ්ගේ අනුමැතියෙන් තොරව ලබා ගත නොහැකි මෙන්ම අපට ඉල්ලීම් කිරීමට පවා නොහැක. ඇතැම් විට ඔහුගේ ආශීර්වාද අපට නොලැබීමට අපම හේතු විය හැක. අපි අපගේ පරමාධිපතිගෙන් ඉල්ලීම් නොකළහොත්, ඔහුගේ උත්තරීතර භාවය අපි හඳුනා නොගතහොත්, ඔහුට නිත්‍ය ලෙස ප්‍රශංසා නොකළහොත්. අල්ලාහ්ට සමීප වීමේ අවස්ථාව පවා අපි අහිමි කර ගනිමින්, අපගේ ප්‍රාර්ථනාවන්ට ඔහුගේ පිළිතුරු නොලැබී යාමට ඉඩ තිබේ.

وَلِلَّهِ الْأَسْمَاءُ الْحُسْنَىٰ فَادْعُوهُ بِهَا ۖ وَذَرُوا الَّذِينَ يُلْحِدُونَ فِي أَسْمَائِهِ ۚ سَيُجْزَوْنَ مَا
كَانُوا يَعْمَلُونَ (١٨٠)

"අලංකාරවත් නාමයන් අල්ලාහ්ට හිමිය. ඒවායින් ඔහුට අමතනු. ඔහුගේ නාමයන් විකෘති කරන්නන් නොසලකා හරිනු. ඔවුන් කරමින් සිටි දැයෙහි ඵල විපාක ඔවුහු දෙනු ලබන්නෝය." සූරා 7:180

3. අපි අපේක්ෂා කළ කාලය තුළ අල්ලාහ්ගේ උදව් නොලැබුණේ යැයි වරදවා සිතා, උදව් පතා අල්ලාහ් වෙත දිගු කළ අත් ලහි ලහියේ අකුලා නොගත යුතුය. එපමණක් නොව, අපි පතන දේ දීමට අල්ලාහ්ට නොහැකිය, හෝ ඔහු දීමට අකැමැතියි හෝ ඔහු මසුරු බවද අපගේ අවශ්‍යතා ගැන නොසලකන බව හෝ වරදවා නිගමනය කර, අපේ අපේක්ෂාවන් අත හැර නොදැමිය යුතුය. බොහෝ අවස්ථාවන්හි, වෙනත් මාර්ගයකින් අපට ලබා ගත නොහැකි නිසාම අල්ලහ්ගෙන් පමණක් අපි පතන දේ, සීඝ්‍රගාමි තැපැල් මාර්ගයෙන් පැමිණෙන්නේ නැත.

අපි අපේක්ෂා කළ වෙනස ඇතැම් විට ලැබිය හැක. නැතහොත් ප්‍රමාද වී ලැබිය හැක. කෙසේ වෙතත් මෙය ලැබීම හෝ නොලැබීම අල්ලාහ්ගේ උදව්වෙන් සහ අපේම දැඩි පරිශ්‍රමයෙන් සිදු වන බව අපි අවබෝධ කර ගත යුතුය.

4. ඉවසීමෙන් හා ස්ථිර අරමුණින් ඉගෙන ගන්නා පාඩම් බොහෝ වැදගත්ය.

وَاسْتَعِينُوا بِالصَّبْرِ وَالصَّلَاةِ ۚ وَإِنَّهَا لَكَبِيرَةٌ إِلَّا عَلَى الْخَاشِعِينَ (٤٥) الَّذِينَ يَظُنُّونَ أَنَّهُم مُّلَاقُو رَبِّهِمْ وَأَنَّهُمْ إِلَيْهِ رَاجِعُونَ (٤٦)

“තව ද නුඹලා ඉවසීමෙන් සහ සලාතය ඉටු කිරීමෙන් උදව් පතනු. සැබැවින් ම එය (සලාතය) දේව බියෙන් යටහත් වන්නන් ට හැර සෙසු අය ට බැරෑරුම් ය. ඔවුහු කවරහු ද යත් සැබැවින් ම තමන් තම පරමාධිපති ව මුණ ගැසෙන්නන් බව ද සැබැවින් ම තමන් ඔහු වෙත නැවත යොමු වන්නන් බව ද වටහා ගනිති.” සූරා 2:45, 46

තමා වාචික ව නොකඩවා කළ ඉල්ලීම් වලට බලාපොරොත්තු වූ අයුරින්ම ප්‍රතිචාරය නොලැබුණේ නම්, වෙනත් අයුරින් තමන්ට වෙනසක් සිදු වුණා දැ යි සොයා බැලිය යුතුය.

ඇතැම් විට කීර්ති නාමය හා ධනය බලාපොරොත්තු වූ කෙනෙක්, මහන්සි වී ඉටු කළ යුතු නමුත් ස්ථිර රැකියාවක් ලැබුවේ නම්, එයින් අවශ්‍ය ආදායමක් ලැබුවේ නම්, එම රැකියාවෙන් සිතට සහනයක් ද, සගයන්ගෙන් ගෞරව හා විශ්වාසය දිනා ගත හැකි වුයේ නම්, එම රැකියාව ගැන ඔහු තෘප්තියට පත්විය යුතුය. තම බැතිමතාගේ හැකියාව හා සැබෑ අවශ්‍යතාව ගැන සියල්ල දන්නා අල්ලාහ් ඔහුට දුන් පිළිතුර එම තත්ත්වය විය හැකිය.

## වෙනස පිළිගැනීමට සූදානම් වීම

ඇතැම් විට සියල්ල පිළිබඳ ව අවබෝධ සහිත අල්ලාහ් අප කළ ඉල්ලීම් අපහට ලබා දීමට සුළු කාලයක් ගත වන්නේ නම්, එම කාලය අපට දෙනු ලැබුවේ, එසේ ලැබෙන වෙනස්කම් සඳහා අපි කෘතඥවීමට සහ එය අපගේ වර්තමාන ජීවන ශෛලය හා ඒකාබද්ධ කිරීමට අපි සූදානම් වීම සඳහා අපට දෙනු ලබන අවස්ථාවක් විය හැක. අල්ලාහ්ගෙන් දෙන ලද මෙම වෙනස ඇතුළත් කරනු පිණිස, අපගේ වර්තමාන ජීවන ශෛලයේ ඇතැම් වෙනසක් සිදු වීමට අවශ්‍ය විය හැක. නිදසුනක් වශයෙන් අලුත් විදුලි භාණ්ඩයක් ලැබුණේ නම්, එය භාවිත කිරීමේ දැනුම පමණක් නොව නිවසේ විදුලි බලය ද තිබිය යුතය. එසේ නොවන විට ලැබුණු නව භාණ්ඩයෙන් කිසිදු ඵලක් නැත. එමෙන්ම නවක තනතුරක් ලැබුණේ නම්, එහි රාජකාරි කිරීම සඳහා අවශ්‍ය දැනුම, ඉවසීම සහ එඩිතරකමක් තිබිය යුතුය. එසේ නොවේ නම්, එය තවත් අලංකාර භාණ්ඩයක් බවට පමණක් පත් වනු ඇත. ඇතැම්

විට නවක පරිසරයක නිසියාකාර ව ක්‍රියා කිරීම සඳහා පුහුණුවීමේ කාලයක් අවශ්‍ය විය හැක. මෙම පුහුණුවීමේ කාලය පවා අල්ලාහ්ගෙන් ලැබු ආශීර්වාදය වේ.

## ප්‍රතිඵල දැක ගැනීම

අපි සියලු දෙනාම දෛනික ව අලුත් යමක් ඉගෙන ගනිමින් සිටිමු. අපගේ ජීවිත ගමනේ සැබෑ අරමුණින් අල්ලාහ්ගෙන් ප්‍රාර්ථනා කිරීම බොහෝ වැදගත්ය. මේ සඳහා රමදාන් මාසයේ උපවාසය ගෙන දෙන ස්වයං පාලනය, අපට වඩා දුගී දුප්පත් අයට කැමැත්තෙන් උපකාර කිරීම තුළින් අපේම අඩුපාඩු කෙරෙහි අපේ දැස් විවෘත කර, අල්ලාහ් ඉදිරියේ අපි කෙතරම් අසරණභාවයට පත් ව සිටිමු දැ යි අපට වටහා ගත හැක. තවද අපගේ සැබෑ අවශ්‍යතා කුමක් දැ යි අපට පෙන්වා දිය හැක්කේ, මුළු විශ්වයම මවා පෝෂණය කරන අල්ලාහ්ට පමණි.

එනිසා කුසගින්නේ හා පිපාසයෙන් සිටින මෙම රමදාන් මාසයේ ඉගෙන ගත යුතු පාඩම් කිසිවක් අතපසු නොකරමු. අපගේ මූලික අවශ්‍යතාව වන අපගේ මැවුම්කරු අපෙන් බලාපොරොත්තු වන්නේ කුමක් දැ යි වටහා ගැනීමට අල්ලාහ්ගෙන්ම උපකාර පතමු. අපගේ ජීවිතයේ සෑම මොහොතක් සඳහාම අපි ගිණුම් පෙන්විය යුතු ව තිබේ. මෙම භාග්‍ය ලත් මාසයේ එම දැනුම වෙත ළඟා විය හැකි මාර්ගය සලසා දුන් අල්ලාහ්ගේ කරුණා ව සඳහා කෘතඥ වෙමු.

IslamHouse.com

أَمْ حَسِبْتُمْ أَن تَدْخُلُوا الْجَنَّةَ وَلَمَّا يَأْتِكُم مَّثَلُ الَّذِينَ خَلَوْا مِن قَبْلِكُم ۖ مَّسَّتْهُمُ الْبَأْسَاءُ وَالضَّرَّاءُ وَزُلْزِلُوا حَتَّىٰ يَقُولَ الرَّسُولُ وَالَّذِينَ آمَنُوا مَعَهُ مَتَىٰ نَصْرُ اللَّهِ ۗ أَلَا إِنَّ نَصْرَ اللَّهِ قَرِيبٌ (٢١٤)

“නුඹලාට පෙර ඉකුත් වූවන්ට සේ නුඹලාට ද (යමක්) නොපැමිණ ම නුඹලා ස්වර්ගයට පිවිසෙන්නට සිතන්නෙහු ද? දුෂ්කරතා හා උවදුරු ඔවුන් ව ග්‍රහණය කළේය. රසූල්වරයා ද ඔහු සමඟ වූ විශ්වාස කළවුන් ද අල්ලාහ්ගේ ජයග්‍රහණය කවදා දැ යි අසන තරමට ම ඔවුහු කම්පනයට පත් කරනු ලැබූහ. සැබැවින්ම අල්ලාහ්ගේ උපකාරය ඉතා සමීප බව දැන ගනු.” සූරා 2:214

إِذَا جَاءَ نَصْرُ اللَّهِ وَالْفَتْحُ (١) وَرَأَيْتَ النَّاسَ يَدْخُلُونَ فِي دِينِ اللَّهِ أَفْوَاجًا (٢) فَسَبِّحْ بِحَمْدِ رَبِّكَ وَاسْتَغْفِرْهُ ۚ إِنَّهُ كَانَ تَوَّابًا (٣)

“අල්ලාහ්ගේ උදව්ව හා ජය ප්‍රීත පැමිණුනු කල්හී. තවද අල්ලාහ්ගේ මාර්ගයෙහි මිනිසුන් කණ්ඩායම් වශයෙන් ඇතුළු වනු නුඹ දකින්නේය. එහෙයින් නුඹ සුවිශුද්ධි කරනු, ඔහුගෙන් ක්ෂමාව ඉල්ලනු. සැබැවින්ම ඔහු පසුතැවිලි වීම භාර ගන්නේය.” සූරා 110: 1 සිට 3 දක්වා.

නිමි